## මහානාම හිමියන්ගේ කාර්යභාරය

කලාවැව නිර්මාණය කර ඇත්තේ කලාඔය හරස්කිරීමෙනි. එසේ කිරීමට හේතුව ලෙස මහාවංසය දක්වන්නේ ධාතුසේන කුමරු ද්‍රවිඩයන්ගෙන් බේරා ගෙන යන මහානාම හිමි තමන්වහන්සේගේ හා කුමරුගේ ගමනට බාධාවක් වූ කලාඔයේ ගමනට (ගළා යෑමට) බාධා කර වැවක් තනන ලෙස කුමරුගෙන් ඉල්ලීමය. ඒ ඉල්ලීමට ගරුකිරීමක් ලෙස ධාතුසේන කුමරු රජ වූ පසු කලාඔය හරස්කර කලාවැව නිර්මාණය කර ඇත.

සිංහලයන් එතෙක් වැව් බැඳ තිබුණේ ජල මාර්ග වූ ගංගා ඔය ආදිය හරස්කර නො වේ. හැකිතාක් ස්වාභාවිකත්වය සමග ජීවත් වූ සිංහලයෝ යක්ෂ සංස්කෘතියට මෙන් ම සිංහල ථෙරවාද බෞද්ධ සංස්කෘතියට ද එකඟ ව වැවු තාවුල්ල හා පෝෂණ ප්‍රදේශ පදනම් කරගෙන ස්වාභාවික ව වැව් පිරවීමට කටයුතු කළහ. ඔවුන් ඇළ වේලි තනා වැව් ජලය වෙනත් වැව්වලට ද ගෙන ගියහ. එහෙත් මූලධර්මයක් ලෙස මෙන් වැව් නිර්මාණයෙහි දී ජලමාර්ගවලට අවහිර නො කළහ.

මහාවංස කතුවරයාණන් වහන්සේ කලාවැව මෙරට වැව් බැඳීමේ සංස්කෘතියට පටහැණි බව දැන සිටියේ යැයි සිතිය හැකි ය. කලාවැව නිර්මාණය කිරීම යුක්ති යුක්ත කිරීමක් ලෙස කලාඔය මහානාම හිමියන්ගේ හා ධාතුසේන කුමරුගේ ගමනට බාධා පැමිණ වූ ඔයකට දඬුවම් කිරීමක් ලෙස කලාවැව නිර්මාණය කරන ලදී යන අදහස තහවුරු කිරීම මහාවංස කතුවරයාණන් වහන්සේගේ වෑයම වී ඇත. එවැනි කතාවක් මහාවංසයට ඇතුල් කිරීමෙන් ම කලාවැව නිර්මාණය අපේ වැව් නිර්මාණය කිරීමේ සම්ප්‍රදායෙන් බැහැර වී ඇති බවත් ජනතාවගෙන් ඒ නිර්මාණය රැකගැනීමට මහාවංස කතුවරයාට අවශ්‍ය වූ බවත් පෙනී යයි. ජනතාව මේ වැව නිර්මාණය ප්‍රශ්න කළා විය හැකි ය,

කලාවැව නිර්මාණයෙහි දී රහතන් වහන්සේ නමක පිරිනිවන් පත්කිරීමට ධාතුසේන රජතුමා ක්‍රියාකිරීමෙන් ජනතාව අතර එතුමා කළකිරීමට පත්වන්නට ඇත. මහාවිහාරයේ පක්ෂපාතීත්වය දිනා සිටි රජතුමා එසේ කෙළේ ඇයි දැයි සිතා ගැනීම තරමක් අසීරු ය. මහාවංසය මේ සිද්ධිය විස්තර කරන්නේ රජතුමාට කාශ්‍යප කුමරු පැණවූ මරණ දඬුවම ඒ පාප කර්මය හා සම්බන්ධ කිරීමට ය. කෙසේ වෙතත් ඒ පංචානන්තරීය පාප කර්මයකි. එයට රජතුමාගේ මරණින් පසුව දැඩි දඬුවමක් ලැබෙන්නට ඇත.

වැවක් තැනවීමට ගොස් රජතුමාට එතරම් පාප කර්මයක් සිදු කිරීමට සිත දුන්නේ වැව ඉතා ඉක්මණින් නිර්මාණය කිරීමට ය. එවැන්නකට පවා රජු පෙළඹවූයේ කුමක් නිසා දැයි අපි නො දනිමු. වැවේ කටයුතු එතරම් ඉක්මන් කිරීමට රජතුමාට අවශ්‍ය වූයේ ඇයි? අපේ වංසකතාවල වෙනත් කිසිම රටක ඇති පොත්වලට වඩා ඉතිහාසය අඩංගු වෙයි. එහෙත් වංසකතාවල ප්‍රධාන ප්‍රශ්නය එයින් කියැවෙන්න නොව නොකියැවෙන්න ය. මෙරට යක්ෂ සංස්කෘතිය ගැන බොහෝ දේ සඳහන් නොකිරීම හේතුවෙන් අපේ ඉතිහාසයෙන් යම් කොටසක් අපට අහිමි වී ඇති බව පැහැදිලි ය.

අප මෙහි දී සඳහන් කරන්නේ අදහස් කිහිපයක් පමණකි. ඒ අදහස් අප දැනට දන්නා ඉතිහාසය සමග සංගත විය යුතු ය. ඓතිහාසික ව හා පුරාවිද්‍යාත්මක ව අප හමුවේ ඇති සාක්ෂි සමග සංගත ව වංසකතාවලට ඌණ පූරණයක් කිරීම පමණක් අපේ උත්සාහය වෙයි. කලාවැව ආශ්‍රිත ව ඇති කතාවලින් හා රජුගේ මරණය සම්බන්ධ කරුණුවලින් අපට පෙනී යන කරුණක් නම් කලාවැව නිර්මාණයට ජනතාවගේ එතරම් ප්‍රසාදයක් තිබි නොමැති බව ය. එයට හේතුව යක්ෂ ගෝත්‍රිකයන් ඒ සම්බන්ධයෙන් දක්වන ලද විරෝධතාව යැයි සිතිය හැකි ය.

අප කතාකරන්නේ මෙරට ඉතිහාසයේ වැදගත් ඇතැම් විට වැදගත් ම සන්ධිස්ථානය ගැන විය හැකි ය. මහාවංස කර්තෘ මහානාම හිමියෝ ධාතුසේන කුමරු කුඩා කළ සිට ම ඇති දැඩි කළාහු පමණක් නොව රජකමට ද පුරුදු කළහ. උන්වහන්සේ නෑ කමින් කුමරුගේ මාමා වූ සේක. මෙහි දී කිවයුතු කරුණක් වනුයේ මහානාම හිමියන් මහාවංස කතාව මහසෙන් රජුගෙන් අවසන් කරන බව ය. ධාතුසේන පුවත වාර්තාකර තබන ලද්දේ උන්වහන්සේ විසින් නො වේ. ඒ පසුව කරන ලද්දකි.

© Prof. Nalin De Silva

ධාතුසේන කුමරු කුඩා කල මෙරට යක්ෂ ගෝත්‍රිකයන්ගෙ ආධිපත්‍යයද වැඩී ගිය කාලයක් විය යුතුම ය. මහසෙන් රජු සමයේ දී ද වැඩෙමින් පැවති යක්ෂ ගෝත්‍රික බලය ධාතුසේන යුගය වන විට රාජ්‍ය බලයට අභියෝග කිරීමට තරම් වැඩී සිටින්නට ඇත. මේ පිලිබඳ ව අන් කිසිවකුට ද වඩා හොඳින් දැන සිටින්නට ඇත්තේ මහානාම හිමියන් විය හැකි ය. මහාවංසය ලියු උන්වහන්සේ හිතා මතා ම මෙන් මහසෙන් යුගයෙන් තමන්වහන්සේගේ කෘතිය අවසන් කරන්නේ මේ බල අරගලය පිළිබඳ මනා අවබෝධයක් උන්වහන්සේට තිබූ නිසා විය හැකි ය. මහාවංසයේ ප්‍රධාන අරමුණක් වී ඇත්තේ ම යක්ෂ ගෝත්‍රික බලපෑම් අමතක කරවීම ය.

කලාඔය හරස් කර කලාවැව නිර්මාණය කිරීමට උපදෙස් දී ඇත්තේ ද මහානාම හිමියන් ය. ධාතුසේන කුමරු කුඩාකල සිට ම මහානාම හිමියන් එකුමරු පුහුණු කර ඇත්තේ කිසියම් අරමුණක් හා පිළිවෙළක් අනුව ය. මෙරට සමාජයීය බලය යක්ෂ ගෝත්‍රිකයන්ගෙන් අර්ධ වෛදිකයන්ට ලබාදීමට උන්වහන්සේ තරම් සිතා මතා කටයුතු කළ අයකු තවත් නැති තරම් ය. උන්වහන්සේ එක් පැත්තකින් මහාවංසය රචනා කළහ. අනෙක් පැත්තෙන් ධාතුසේන කුමරු රජකමට පුහුණු කළහ.

මහානාම හිමියන් ධාතුසේන කුමරුට කියා දෙන්නට ඇත්තේ අර්ධ වෛදිකයන්ගේ බලය තහවුරු කරන ආකාරයේ ඉතිහාසයක් බවට සැකයක් තිබිය නො හැකි ය. එහෙත් උන්වහන්සේ ධාතුසේන කුමරුට යක්ෂ සංස්කෘතියට ද පටහැණි කරුණු ප්‍රගුණ කළාහු ද? මේ ප්‍රශ්නයට දිය හැකි පිළිතුර නම් ඔව් යන්න ය. මහානාම හිමියන්ට අනුව රාජ්‍යයට දෙපැත්තකින් තර්ජන තිබෙන්නට ඇත. එක් පැත්තකින් ද්‍රවිඩ ආක්‍රමණය . දක්ෂිණ භාරතයෙන් එල්ල වූ මේ තර්ජන හමුවේ රට භින්න භේද කිරීමට තරම් අවභ්‍යතාවක් උන්වහනාසේට නොතිබෙන්නට ඇත. අනෙක් පැත්තෙන් යක්ෂ ගෝත්‍රිකයන්ගේ බලය මෙල්ල කිරීමේ අවශ්‍යතාව ද උන්වහන්සේට විය.

යක්ෂ ගෝත්‍රිකයන්ගේ බලය මෙල්ල කදරීම යනු ඔවුන්ගේ සංස්කෘතියේ බලපෑම ද යම් ප්‍රමාණයකට වුවත් අඩුකිරීම ය. ඒ සම්බන්ධයෙන් උපදෙස් උන්වහන්සේ ධාතුසේන කුමරුට කුඩාකල සිට ම දෙන්නට ඇත. එමෙන් ම නව තාක්ෂණයක් ද රටට හඳුන්වාදීමේ වගකීමක් උන්වහන්සේ දකින්නට ඇත. මේ සියල්ල එකතු වු කල කලාඔය හරස්කර කලාවැව බිහිකිරීමේ අවශ්‍යතාව උන්වහන්සේ ධාතුසේන කුමරුට කුඩාකල ම කියා දෙන්නට ඇත.

එහෙත් උන්වහන්සේ දූරදර්ශී වී ද්‍රවිඩයන් පරාජය කරන තුරු යක්ෂ ගෝත්‍රිකයන්ට එරෙහි කටයුතු කල් දමන්නට ඇත. ද්‍රවිඩයන් පරාජය කිරීමෙන් පසුව මහානාම හිමියනාගේ ද ධාතුසේන රජළුගේ ද සිත් යොමුවන්නට ඇත්තෙ ඔවුන්ට අනුව දෙවැනි වැදගත් කාර්යය වූ යක්ෂ ගෝත්‍රික බල මර්දනය ය. ඒ කටයුතු හැකි ඉක්මණින් අවසන් කිරීමට ධාතුසේන රජුට වුවමනාවක් තිබූ බව පෙනෙයි. සමහර විට එයට හේතුවක් වන්නට ඇත්තේ යක්ෂ ගෝත්‍රියන්ට සංවදථානය වීමට තරම් කාලයක් ලබා නො දීම ය.

ධාතුසේන රජු යක්ෂ සම්ප්‍රදායෙන් හා සිංහල සංස්කෘතියෙන් බැහැරට ගිය එකම තැන කලාවැව නිර්මාණය නො වේ. අවුකන බුදු පිළිම වහන්සේ නිර්මාණය කිරීමේ දී ද රජතුමා ථෙරවාදී සම්ප්‍රදායෙන් තරමක් බැහැර වී ඇත. මහානාම රජු (බු ව 955 - 977) දවස මෙරටට බුද්ධඝෝෂ හිමියන් වහන්සේ ඇතුළු ආනන්ද භික්ෂූන් වහන්සේලා ථෙරවාදය ආරක්ෂා කිරීම සඳහා ඇතැම් පියවර ගත්ත ද මහායාන අදහස් වෙනත් ආකාරයකින් රටට ඇතුළු වීම වැළැක්වීමට නොහැකි වී ඇත. ඇතැම් විට දන්ත ධාතුන් වහන්සේ වැඩම කිරීමත් සමග මහායාන අදහස් අඩුම තරමින් කලාවෙහි හා පොදුජන ජීවිතයෙහි බලපෑම් ඇති කරන්නට ඇත.

මහානාම හිමියන් ධර්මයෙහි කෙසේ වෙතත් ජන ජීවිතයෙහි දී මහායාන අදහස් යම් ප්‍රමාණයක් රටට ඇතුල්වීම අවශ්‍ය යැයි කල්පනා කෙළේ දැයි අපි නො දනිමු. විශේෂයෙන් ම දක්ෂිණ භාරතයහි නැගී ආ ද්‍රවිඩ බලයට මුහුණ දීමට ජන ජීවිතයට මහායාන අදහස් අවශ්‍ය යැයි උන්වහන්සේ කල්පනා කරන්නට ඇත. බුදුන් වහන්සේ ඉතා විශාල කයක් සහිත ව නිර්මාණය කිරීමෙන් එක් පැත්තකින් බුදුන් වහන්සේගේ ගුණකාය සමග සංසන්දනය කිරීමෙද දී අපේ කුදු බව (ක්ෂුද්‍ර භාවය) අපට වටහාගැනීමට සලසා දෙයි.

© Prof. Nalin De Silva

ධර්මය පැත්තෙන් ගත්කල අප ථෙරවාදය ආරක්‍ෂා කරගෙන ඇති අතර පූජාවිධි සම්බන්ධයෙන් එසේ කරගෙන නොමැති බව පැහැදිලි ය. මෙද කරුණු සම්බන්ධයෙන් මෙරට ඉතිහාසඥයන් හා වෙනත් උගතුන් කර ඇති අධ්‍යයනයන් කිසිසේත්ම ප්‍රමාණවත් නො වේ. අද මෙරට සිංහල බුද්ධාගම යනු ධර්මය සම්බන්ධයෙන් ගත්කල සමස්තයක් ලෙස ගත්කල ථෙරවාදීවුත් පූජාවිධි සම්බන්ධයෙන් ගත්කල යම් ප්‍රමාණයකට මාහායානවුත් බුද්ධාගමකි. එහි වරදක් ඇතැයි කිවහැකි නො වේ. එසේ නොවන්නට සමහර විට මෙරටින් හා ඒ හේතුවෙන් ලෝකයෙන් ම සිංහල ජාතිය හා සංස්කෘතිය අතුරුදහන් වීමට ඉඩ තිබිණි.

අප මහානාම හිමියන් ගැන දන්නේ මහාවංසයෙහි කර්තෘ ලෙස හා ධාතුසේන කුමරුගේ මාමා හා ආරක්‍ෂකයා ලෙස ය. එහෙත් උනාවහන්සේ එයට වැඩි යමක් මෙරට ඉතිහාසයට (එකල නම් අනාගතයට) එක්කර ඇත. ඒ ඒ කාලයෙහි මෙරට වැඩ විසූ බුද්ධිමත් භික්‍ෂූන් වහන්සේ දූරදර්ශීව යම් යම් පියවර ගෙන සිංහල බෞද්ධ සංස්කෘතිය වෙනස්කිරීමට කටයුතු කළ නිසා ම සිංහල බෞද්ධ සංස්කෘතිය  කිනම් ආකාරයකින් වුව සුරක්ෂිත වී ඇත. අප මෙද කරුණු හොඳින් අවබෝධ කරගත යුත්තේ අද අප නැවත වරක් කළ යුතු වෙනස්කම් කවරේදැයි සාකච්ඡා කරමින් සිටින බැවිනි. බටහිර සංස්කෘතික ආධිපත්‍යය, දෙමළ ජාතිවාදය හමුවෙහි අප කරනානේ කුමක් ද යන්න ගැන අපට යම් අවබෝධයක් තිබිය යුතු ය. මේ අලුත් අවුරුද සමයෙහි ශක්තිමත් ආණ්ඩුවක් පිහිටුවා ඇති බැවින් මේ ප්‍රශ්නය අන් කවරදාටත් වඩා අප සාකච්ඡා කළ යුතු ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**